# SLS භාණ්ඩ සහතිකකරණ ක්‍රමය

භාණ්ඩ සහතික කිරීම, කවුරුත් දන්නා පරිදි "SLS සහතිකකරණය" මගින් භාණ්ඩයක් සඳහා තත්ත්වය පිළිබඳ තුන්වන පාර්ශවයේ වගකීමක් දෙනු ලැබේ.

මෙම සහතිකකරණය මගින් ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූල ලෙස භාණ්ඩ නිෂ්පාදනය කරන දේශීය මෙන්ම විදේශීය නිෂ්පදකයින් ගේ භාණ්ඩ මත SLS ලකුණ සලකුණු කිරීම සඳහා අවස්ථාව සලසාදීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට හැකියාව ඇත. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය 1984 අංක 6 දරණ පනතට සහ ඒ යටතේ නිකුත් කර ඇති රෙගුලාසිවලට අනුව මෙම අවසර පත්‍ර නිෂ්පාදකයින් සඳහා නිකුත් කිරීමට ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයට බලය පවරා ඇත.

භාණ්ඩ සහතිකකිරීමේ ක්‍රියාවලිය ස්වභාවයෙන්ම, අත්‍යාවශ්‍ය ලෙස අනිවාර්ය නොවූ ක්‍රියාවලියකි. කෙසේ නමුත් අභ්‍යන්තර වෙළෙඳාම පිළිබඳ කොමසාරිස්තුමා විසින් 1979 නිකුත් කළ අංක 1 දරණ පාරිභෝගික ආරක්ෂණ පනත යටතේ නිකුත් කරන ලද විධිවිධානයන්ට අනුව මෙම සහතික කිරීම අනුව දේශීය ලෙස නිෂ්පාදනය කරන ලද භාණ්ඩ 20ක් සඳහා අනිවාර්ය කර ඇත. (පාරිභෝගික ආරක්ෂණ පනත 2003 අංක 9 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනත යටතේ අවලංගු කර ඇත. කෙසේ වෙතත් මෙම රෙගුලාසිය නොවෙනස්ව පවතී)

භාණ්ඩයක් මත සහතික ලාංඡනය ඇති විට ඉන් හැඟී යනුයේ එම භාණ්ඩ අදාළ වූ ශ්‍රී ලංකා ප්‍රමිතියට අනුකූව නිෂ්පාදනය කර ඇති බව සහ විශ්වාසයකින් යුතුව එම භාණ්ඩය මිලදී ගත හැකි බවත් වේ.

පිරිවිතරේ අවශ්‍යතාවයන්ට අනුකූල වීම තහවුරු කරනුයේ තත්ත්ව ආරක්ෂණ පද්ධතිය විධිමත් අන්දමින් පාලනය කිරීම සහ ආයතනයේ සුදුසුකම් ලත් විගණන නිලධාරීන් විසින් කරනු ලබන විගණන කටයුතු වලිනි.

සහතික ලාංඡන ක්‍රමයේ පරිපාලනය සඳහා ආයතනයේ සාමාන්‍ය ප්‍රතිපත්ති වනුයේ අදාළ ප්‍රමිතීන්ට අනුකූල වීමේ වගකීම නිෂ්පාදකයෙකු වෙත පැවරීම තුලිනි. මෙය ආරක්ෂා කිරීම සඳහා ආයතනය මගින් සකස් කර ඇති මාර්ගෝපදේශ අනුව සෑම බලධපත්‍රධාරියෙකුම සුදුසු තත්ත්ව ආරක්ෂණ පද්ධතියක් ස්ථාපිත කළ යුතු වේ. එම තත්ත්ව පද්ධතිය ලේඛනගත කිරීම සහ ක්‍රියාත්මක කිරීම නිෂ්පාදකයාගේ වගකීම වන අතර තත්ත්ව පද්ධතියේ නිරන්තර සඵලත්වය **(effectiveness)** තහවුරු කිරීම ආයතනයේ සුදුසුකම් ලත් නිලධාරීන් විසින් නම් කළ කාල අන්තර වලදී සිදු කරනු ලැබේ.

## වාර්ෂික ගාස්තු

**SLS** ලකුණ පාවිච්චි කිරීම සඳහා අවසර පත්‍රය පිරිනැමීමෙන් පසුව. වාර්ෂික ගාස්තුව අය කරනුයේ එම භාණ්ඩයේ වාර්ෂික මුලු විකුණුම් ප්‍රමාණය මත වේ.

වාර්ෂික ගාස්තුව තුන් මසකට වරක් පියවීමට හැකිය.

## අවසර පත්‍රය වැරදි ආකාරයට පාවිච්චි කිරීම හෝ අවසර පත්‍ර අවශ්‍යතා කඩ කිරීම

සහතික ලකුණ ආයතනය මගින් ආරක්ෂා කරන අතර, සහතික පත්‍රයේ වැරදි අකාරයට පාවිච්චි කිරීම හෝ අවසර පත් අවශ්‍යතා කඩ කිරීම ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත යටතේ වරදක් වේ.

එවැනි වැරදි සඳහා දඩ මුදල් හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක සිර දඬුවමක් හිමි වන බව පනතේ විස්තර කර ඇත. තවද නිකුත් කරන ලද අවසර පත්‍රයේ සඳහන් කරුණු සහ අවශ්‍යතා සපුරාලීමට අවසර පත් හිමියා අපොහොසත් වුවහොත් හෝ භාණ්ඩය අදාළ ප්‍රමිතියට අනුකූල නොවුවහොත් නිකුත් කරන ලද අවසර පත්‍රය ඕනෑ ම අවස්ථාවක අවලංගු කළ හැකි වේ.

තවද අත්වැරදීම් සඳහා නිවැරදි මාර්ග ගෙන ඇතිනම් සහ ක්‍රියාවලියේ එම වැඩි දියුණු කිරීම් සුරක්ෂිත කෙරෙන තෙක් සහතික පත්‍රය තාවකාලිකව අත්හිටුවීමට හැකි වේ.

## වලංගු කාලසීමාව

අවසර පත්‍රයේ වලංගු කාලය අවුරුදු 03ක් වන අතර පරීක්ෂා කරන නියැදීන් අදාළ ප්‍රමතියට අනුකූල වීමත්, තත්ත්ව පද්ධතියේ සතුටුදායක ක්‍රියාකාරිත්වයත් සැලකිල්ලට ගෙන සහතික පත්‍රය අලුත් කරනු ලැබේ.

## SLS ලකුණ සඳහා භාණ්ඩ සහතිකකරණයට අයදුම් කළ යුත්තේ කෙසේද

නිෂ්පාදකයින් තමන් නිෂ්පාදනය කරන භාණ්ඩ මත සහතිකකරණ ලකුණු යෙදීමට බලපත්‍රයක් ගැනීමට අනන්දුවක් ඇතිනම්, එම භාණ්ඩය සඳහා ආයතනය මගින් අනමත කර ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකා ප්‍රමිති පිරිවිතරයක් ඇති ද යන්න පළමුවෙන්ම සොයා බැලිය යුතු වේ.

අයදුම්පත්‍ර භාර දීම කළ යුත්තේ ඒ සඳහා සකස් කර ඇති අයදුම් පත්‍රයක වන අතර එක් එක් ප්‍රමිතියකින් ආවරණය වන භාණ්ඩ සඳහා වෙන වෙනම අයදුම් පත් භාර දිය යුතු වේ. (අයදුම් පත්‍ර නිකුත් කරනු ලබන්නේ තත්ත්ව ආරක්ෂණ අංශය මගින් වන අතර සාමාන්‍ය ගාස්තුව
**(LKR 100.00 +15% VAT)**

එකම වෙළෙඳ ලකුණ යටතේ ඇති භාණ්ඩ අයදුම් කරුවන් වෙනස් නිෂ්පාදන ඒකක වල නිෂ්පාදනය කරනු ලබන්නේ නම් එම සෑම නිෂ්පාදන ඒකකයකම එකම වෙළෙඳ නාමයක් මගින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ සඳහා වෙන වෙනම අයදුම් පත් එක් වරම භාරදිය යුතු වේ.

අයදුම් පත් සැකසුම් ගාස්තුව **(LKR 1000.00 +15% VAT)**

## බලපත්‍රය ප්‍රදානය කිරීමට හෝ කරනු ලබන අගැයීම සහ පරීක්ෂාව

අයදුම්පත්‍රය ආයතනයට ලැබුණු පසු අයදුම්පත්‍රයේ සඳහන් කරුණු වලට අනුව තත්ත්ව ආරක්ෂණය සඳහා නිෂ්පාදකයාගේ විධි විධානවල ප්‍රමාණවත් බව අගැයීමක් කරනු ලැබේ.

අයදුම්කරු යොදා ගෙන ඇති තත්ත්ව ආරක්ෂණ පද්ධතිය පිළිබඳව පරීක්ෂා කිරීම හා ස්ථිර කර ගැනීම සඳහා කර්මාන්තශාලාවට ගොස් පරීක්ෂාවක් කරනු ලැබේ. භාණ්ඩ පරීක්ෂා කිරීමට ඇති පහසුකම් සොයා බැලීම සඳහා විශේෂ අවධානයක් මෙම පරීක්ෂාව තුලදී කරනු ලැබේ.

පරීක්ෂණ කිරීමට අවශ්‍ය වන නියැදි කර්මාන්ත ශාලාවෙන් ලබා ගැනීම සඳහා සෑම පහසුකමක්ම අයදුම්කරු විසින් පරීක්ෂකවරුන් හට සැපයිය යුතු වේ.

පරීක්ෂා සහ නියැදි සඳහා වියදම්, නියැදින් පරීක්ෂා කිරීමේ ගාස්තු යනාදිය අයදුම් කරු විසින් දැරිය යුතු වේ.

භාණ්ඩ සඳහා අදාළ ප්‍රමිතියට අනුකූල වන්න් නම්. (එක ළඟ පරීක්ෂා කරනු ලබන නියැදීන් දෙකක් අදාළ ප්‍රමිතියට අනුකූල වීම පරීක්ෂා කර ස්ථිර කළ පසු) සහ තත්ත්ව පද්ධතිය සතුටුදායක නම් සහතිකකරණය සඳහා අවශ්‍ය කරුණු සමග එකගවීම නිසැකවම දැන ගැනීම අවසාන පරීක්ෂණ කණ්ඩායමක් මගින් කරනු ලැබේ.

## අවසර පත්‍රයේ විෂය පථය

එකම පිරිවිතරක් යටතට ගැනෙන නමුත් විවිධ නාමයන් ගෙන් අලෙවි කරන භාණ්ඩ සඳහා වෙන් වෙන් වශයෙන් අවසර පත්‍ර ලබා ගත යුතුය.

භාණ්ඩයක් එකම වෙළෙඳ නාමයක් යටතේ විවිධ කර්මාන්තශාලා වල නිෂ්පාදනය කෙරේ නම්, එක් එක් කර්මාන්තශාලාවේ නිෂ්පාදනය කරන එම භාණ්ඩ සඳහා සහතික පත්‍ර එක්වරම ලබා ගත යුතු වේ.

එකම වෙළෙඳ නාමය යටතේ සියලුම කර්මාන්තශාලාවල නිෂ්පාදනය කරන භාණ්ඩ සියල්ලම අවසර පත්‍රයේ සඳහන් අවශ්‍යතාවයන් සපුරාලන්නේ නැතිනම් සහතික පත්‍රය නිකුත් කරනු නොලැබේ.

## බලපත්‍රය නිකුත් කිරීම

පහත සඳහන් කරුණු සම්පූර්ණ කරන්නේ නම් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ බලය ලත් නිලධාරියෙකු විසින් ආයතනය වෙනුවෙන් නිෂ්පාදකයාට සහතික ලකුණ පාවිච්චි කිරීම සඳහා බලපත්‍රය නිකුත් කරනු ලැබේ.

- අවම වශයෙන් දින 30ක් හෝ කාණ්ඩ 30 ක් වන ලෙස තෝරා ගන්නා ලද අනුගාමී නියැදීන් දෙකක් අදාළ ප්‍රමිතියට අනුකූල වීම

- සතටුදායක තත්ත්ව ආරක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම

සහ

- සාමාන්‍ය හා විශේෂ බලපත්‍ර අවශ්‍යතා සහ වාර්ෂික ගාස්තු ගෙවීම පිළිබඳව අවශ්‍යතා නිෂ්පාදකයා විසින් පිළිගැනීම

  බලපත්‍රය ප්‍රදානය කිරීමෙන් පසු නිෂ්පාදකයා විසින් **SLS** ලාංඡනය භාණ්ඩය මත ප්‍රදර්ශනය කළ යුතුය.

## බලපත්‍රය ලබාදීමෙන් පසු අගැයීම සහ පරීක්ෂාව

නිරන්තරයෙන්ම භාණ්ඩ අදාළ ප්‍රමිති පිරිවිතරයට අනුකූලවීම තහවුරු කිරීම සඳහා තත්ත්ව පද්ධතිය සතුටුදායක ලෙස ක්‍රියාත්මක කිරීම සහ බලපත්‍ර අවශ්‍යතාවයට එකග වීම, කලින් කල සිදුවන විගණන කටයුතු යනදිය නිෂ්පාදකයාගේ කර්මාන්තශාලාවේ දී කරනු ලැබේ.

නිෂ්පාදනායතනයෙන් සහ විවෘත වෙළෙඳ පොළෙන් ගන්නා ලද නියැදීන් යනාදිය පරීක්ෂා කර භාණ්ඩ වල අදාළ ප්‍රමිතියට අනුකූලවීම තහවුරු කරනු ලැබේ.

බලපත්‍රධාරියා විසින් සැමවිටම සියලුම බලපත්‍ර අවශ්‍යතා වලට එකඟ වීම සහ අවශ්‍ය උදව් සහ සහයෝගය ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙත දිය යුතු ය.